// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2144/3 - 2019 ඔක්තෝබර් මස 07 වැනි සඳුදා - 2019.10.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබාගැනීමට රජය අදහස් කරන බැවින්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර*:

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගාල්ල මහ නගර සභා සීමාව තුළ 98ඒ, මඩවලමුල්ල උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මඩවලමුල්ල ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 810039 කළාප 10 හි පත්‍ර 2 හි කැබලි අංක 118 ලෙස පෙන්නුම් කර ඇති හෙක්ටයාර් 0.0023 ක් වූ පහත නමින් දැක්වෙන ඉඩම් කොටස :

**කැබලි අංක 118 – ඉඩමේ නම: ඩිංගිනයිදෙගෙවත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත; ස්ථිර ගොඩනැගිල්ල (මොටර් කාමරය) ක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0023.**

*උතුරට*: කැබලි අංක 119; *නැගෙනහිරට*: කැබලි අංක 119 සහ කැබලි අංක 62; *දකුණට*: කැබලි අංක 62 සහ 60; *බටහිරට*: කැබලි අංක 60.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තමතමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2019 නොවැම්බර් මස 20 වැනි දින පෙ. ව. 9.00 ට ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2019 නොවැම්බර් මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

අයි. හිමාලි රත්නවීර,<br>
ප්‍රාදේශීය ලේකම්,<br>
ගාල්ල - කඩවත් සතර.

2019 සැප්තැම්බර් මස 30 වැනි දින,<br>
ගාල්ල - කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 693

1A - G 31195 - 15 (2019/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.